# ජපානය අනාගත ලෝකයට මඟ පෙන්වන හැටි

**ජපානය කලකට පෙර මානව ගුණ සපිරි රටක් ලෙස ප්‍රකටව තිබුණත් අද එය යන්ත්‍රවලින් පිරුණු ලෝකයක් බවට පත්වී තියෙනවා.**

එදා ජපානයට ආ සංචාරකයන් විස්මයට පත් කළ දෙයක් තමා රට පුරා විසිරි මිනිස් ගුණාංග. හැම විටක ම හැමතැනකදි ම පුද්ගලිකව ම ඉදිරිපත්වී කටයුතු කරදීම. මිනිස් දෑතේ මහිමය කියාපාන කලාත්මක සහභාගිත්ව ය. එයින් ඔවුන් ප්‍රමෝදයට පත් වුණා. සෙන් පන්සල්වල කලාත්මකව සැකසූ බොරළු පාරවල් ගැන හෝ ජපන් අරක්කැමියකු හැදූ සුෂි වැනි රසමසවුලක් ගැන හෝ කවියා හා සංචාරකයන් වර්ණනාත්මකව කතා කරනු එදා නිතර ඇසුණු දෙයක්. සාප්පු යන්නන් වුනත් මවිතයට පත් වුණා, ඉතා වෙහෙස මහන්සිවී සාප්පුවලින් දවටා දෙන තෑගි පාර්සල් ගැන. ඒ වගේම අනික් අතට එක සංචාරක චෙක්පතක් මාරු කරන්නට බැංකු ලිපිකරුවන් රොත්තක් පැය බාගයක් තරම් වේලාවක් ගන්නා විට කලකිරීමකුත් එදා සංචාරකයන් ට ඇතිවෙන්න ඇති.

ඒත් ඒ සියල්ල අද අතීතයට එක්වෙලා. 21 වැනි සියවස ඇරඹෙද්දී ජපානයේ එදිනෙද ජිවිතය යන්ත්‍රවලින් පිරෙන්න පටන් අරන්. ජපානයේ එදිනෙද ජිවිතයේ කටයුතු යාන්ත්‍රිකරණය වෙලා. තෝකියෝවේ යුරිකාමොමේ දුම්රිය පදවන්න රියදුරෙක් නැහැ. ඉහළම පන්නයේ බාබර් සාප්පුවල හිසකේවලට ෂැම්පු දමන්නේත් යන්ත්‍රයකින්. නගානෝවාවල සාප්පුවකින් අයිස්ක්‍රිම් එකක් ඇනවුම් කළොත් ඔබට එය පිරිනමන්නේ කුරුල්ලකු වගේ රොබෝකෙනෙක්. යන්ත්‍රයට තවමත් ඉහළ ම අරක්කැමියකුට වගේ රසට සුෂි හදන්න බැරි වුනත්, ඊට ළඟා වෙන්න හැකි යන්ත්‍රයක් හදන උත්සාහය ඔවුන් අතහැර නැහැ.


ජපනුන් එකිනෙකාට කඳනමා ආචාර කරන හැටි දැක්කම එවැනි සංකීර්ණ සංස්කෘතියක් තවමත් ඉතිරිව ඇති සමාජයක මෙවැනි වෙනසක් දැකීම එක්තරා විදියක පුදුමයක්. ඔවුන් තාමත් දුරකතනයෙන් කතා කරද්දී පවා කඳ නමා ආචාර කරනවා. ඒ අනික් කොණේ තවමත් මිනිසෙක් ඉන්නා බව ඔවුන් දන්නා නිසයි.

එදා මිනිසා කළ වැඩ බොහොමයක් අද කරන්නේ යන්ත්‍ර යි. සාප්පුවල සිටි සේවකයන් සියල්ලම පාහේ අද දක්නට නැහැ. ඒ සියල්ල කරන්න සංකේත හා යන්ත්‍ර අප අතරට ඇවිත්. අපට ඒවා බාර ගන්න සිද්ධ වෙලා තියෙනව. නැත්නම් කොන්වෙනවා. දැන් ජපනුන් යන අතට සෙසු ලෝකයට ම යන්න සිද්ධවෙලා. ඒ නිසා ඔබත් ඔබේ අනාගත ලෝකය හඳුනා ගන්න. ■










## ඉහළ වමේ සිට දකුණට


කියුෂුගේ සාගර මාලිගය තුළ පරිගණක අත්දැකීමක් - පැතලි බෝට්ටුවකින් මුහුදු **සවාරියක්** යන පිරිසක්. එහිදී දිය රැල්ලේ ජල බින්දු තමන් වෙතට විසිරෙනු පවා අත්විඳිය හැකි යි.

තෝකියෝ භෝජනාගාරයක **ස්වයංක්‍රිය සූෂි** රසමසවුළු නිපදවන අරක්කැමි යන්ත්‍රයක්

තෝකියෝ ප්‍රථම රියැදුරු රහිත දුම්රිය වූ **යූරිකාමොමේ** දුම්රියේ ගමන් කරන මගීන්







## ඉහළ-වමේ සිට දකුණට

කොටට කපා තිබුණත්, දිගට වවා තිබුණත් **හිස් සෝද ෂැම්පූ කළ හැකි යන්ත්‍රයකින්** සේවාවක් ලබන කතක්.


මට්සුමොටෝ නගරයේ අයිබෝ **සුනඛ රොබෝ** ප්‍රදර්ශනයේ දී රොබෝ සුනඛ සුරතලුන් හසුරුවන පිරිසක්.


තෝකියෝ නගරයේ විද්‍යුත් භාණ්ඩ අලෙවි හලක තුනී තිරයක් සහිත **ප්‍රක්ෂේපණ රූපවාහිනියක්** නරඹන අයෙක්.


තෝකියෝ ප්‍රථමවරට විවෘත කෙරුණු මුළුමනින්ම **ස්වයංක්‍රිය පාරිභෝගික භාණ්ඩ අලෙවි හල.**


කම්යෝකා නගරයේ මහලු නිවාසයක **යාන්ත්‍රික අශ්වයකු** පිට යන වැඩිහිටි අයෙක්. මෙයින් විනෝදයක් මෙන් ම කොන්දේ අමාරුවලට පිළියම් ද සපයයි.

















## ඉහළ - වමේ සිට දකුණට..

ත්‍රිමාන දර්ශනවලින් ක්‍රීඩකයන් ඇද බැ... තබා ගන්නා අධිතාක්ෂණ පරිගණක ක්‍රීඩා යන්ත්‍රයකි.

යෝධ තීරයේ පාවෙන මාළු බලමින් රාත්‍රී ආහාර ගන්නා පිරිසක්

කුරුල්ලකු ගේ බඳු අතකින් අයිස්ක්‍රීම් පිළිගන්වන අයුරු

තෝකියෝවේ දී සූරතල් රොබෝ බලලකු දියත් කළ මොහොත

පැනා රොබෝ කපුරු මල්ගොමුවක මල් නෙළන අයුරු

